# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2444/20 – 2025 ජූලි මස 08 වැනි අඟහරුවාදා – 2025.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/86/2013.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2018.10.03 වැනි දින අංක 2091/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.09.12 වැනි දින දරන නියෝගයෙන්,

ඒ. ඩී. ජයසිංහ මයා, අංක 735, සුදර්ශන මාවත, හිඹුටුවැල්ගොඩ, කැළණිය.

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

අතර පවත්නා 2018.08.28 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එල්. ආර්. සුමතිපාල මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු එල්. ආර්. සුමතිපාල මයා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.09.12 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු**,
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 – 0084/1



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/10/86/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඒ. ඩී. ජයසිංහ මයා, අංක 735, සුදර්ශන මාවත, හිඹුටුවැල්ගොඩ, කැළණිය.

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/86/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ. ඩී. ජයසිංහ මයා, අංක 735, සුදර්ශන මාවත, හිඹුටුවැල්ගොඩ, කැළණිය.

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සැපයුම් නිලධාරියෙකු ලෙස සේවය කළ ඒ. ඩී. ජයසිංහ මහතා හට 2005.04.01 දින සිට ලබාදීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 4 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා නොදීම සහ ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරි හා සැපයුම් කළමනාකරු යන තනතුරුවලට අදාළ උසස්වීම් ලබානොදීම යුක්ති සහගතද? එසේ නොවන්නේ නම් ඒ. ඩී. ජයසිංහ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.”

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0084/2

මගේ අංකය: IR/COM/01/2024/133.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ෆ්ලයිට් එටෙන්ඩන්ට්ස් යුනියන්, අංක 01, ජයකොන්ත පටුමඟ, කිරුළ පාර, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, නීතිඥ ඕබඩගේ ලීලාරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2024/133.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ෆ්ලයිට් එටෙන්ඩන්ට්ස් යුනියන්, අංක 01, ජයකොන්ත පටුමඟ, කිරුළ පාර, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ජී. කේ. එලිකේවෙල යන අය සම්බන්ධයෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් විසින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණය අනුව නිකුත් කරනු ලැබූ 2019.07.17 දිනැති ලිපිය මගින් වරදකරු කිරීම සහ එමගින් නියම කරනු ලැබූ දඬුවම් තුළින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0085

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.